පසුතුර(රු), *n.*=ප්‍රත්‍යුත්තරය [cut

පසුත්, *ppa.* (from පසිඳි) examined, adjudged,

පසුත්, *ad.* afterwards, again. *n.* -තැවි(*b.*), =පසුතැවිල්ල

පසුලු, *a.* near

පසුපස්සෙ, *n.*=*ad.* behind, after

පසුබට, *a.* retrograding, neglecting, backsliding. *vi.*-වෙ, to backslide, to be disheartened

පසුබත(ත්), *n.*=පස්බත

පසුබසි(or සි), *vt.* to retreat (පසුබැස්ස)

පසුබා, *vt.* to cause to retire, to defeat (පසුබෑ)

පසුම්බිය, } *n.* small vallet or purse
පසුඹිය, }

පසුර(රැ), *n.* foot, raft, claw, finger-nail

පසුව, *ad.* after, afterwards

පසුවෙ, *vi.* to lag behind, to be passed, elapse, [to remain

පසේබුදු(*b.*), *n.*=ප්‍රත්‍යෙකබුද්ධ

පහ, *n.* palace, mansion, touch, five [පැහු)

පහ, *vt.* to solder, to weld, to leave (පැහැස්සු,

පහකර, *vt.* to cast off, to drive away, to reject

පහච්චුකර, *vi.* to play tricks, to deal cunningly

පහට, *ppa.* struck (*v.* පහර)

පහට්ඨ, *a.* pleased, delighted

පහණ(ත්), *n.* stone, gravel, lamp, morning

පහණබඩය, *n.*=ශපාල්පලා

පහණවැස්ස(-වැසි), *n.* hail

පහත්, *a.* low, lower. *vt.* -කර, to lower, to let down. *vi.* -වෙ, to incline downwards, to be lowered

පහත(ත්), *n.* place below, under

පහතල, *n.* upper story of a palace or mansion

පහදොර, *n.* door or gate of a palace or mansion

පහදු, *vt.* to make clear, to please (පැහැදි)

පහදුව, *vt.* to cause to clear, to please (පැහැදෙවු)

පහදි, *vi.* to become clear, to be pleased (පැහැදුණු)

පහන්, *a.* pleased, clear (*r.* පහණ)

පහන්කඩ-ය, *n.* wick of a lamp or candle

පහන්කිච්චා(-කිච්චි), *n.* magpie (*v.* පොල්කිච්චා)

පහන්තල-ය, *n.* surface of a stone, flat stone

පහන්කණුව(ණු), *n.* lamp post, light-house

පහන්දැල්ල(-දැලි), *n.* flame of a lamp

පහන්රූක(ක්), *n.* candlestick, lamp-stand

පහන්වැස්ස(-වැහි), *n.* bail (*v.* පහණවැස්ස)

පහන්වෙ, *vi.* to become morning, to dav

පහන්සිළ(ළු), *n.* flame of a lamp

පහන(න්), *n.*=පහණ

පහ-ය, *n.* palace, mansion

පහසින්(*b.*), *n.* adorning, ornament

පහර, *n.* blow, stroke, contact

පහර, *vt.* to strike, to evacuate by to strain, to plunder (පැහැරී)

පහරස, *a.* hard, solid, firm

පහව, *vi.* to be separated (පහවූ)

පහස(ස්), *n.* touch, sense of feeling

පහසු, *a.* easy, convenient, hale

පහළ, *a.* published, made known, manifest. *vi* -වෙ, to become known, to be manifest, to spring into existence

පහළොව, *n* (*ifn.* පහළොස)

පසළොස(ක්), } *n.* fifteen. *n.* පසළොස්වක, fif-
පසළොස, } teenth day, day of the full-moon

පහ, *n.* touch, palace, mansion

පහා, *pp.* (from පහ) having left or rejected

පහිඩු-ව, *n.* a mark branded on cattle

පහිඹ(න්), }
පහෙළ(ළ්), } *n.* sandal, kind of loose slippers

පහු, etc. = පසු, etc.

පහුරු(රු), *n.* raft, claw, finger-nail

පහුරනවා, *vt.* to scratch (with the nails or claws)

පහුව, *ad.* after, afterwards

පල්ලි-ය, *n.* temple, church, place of worship, school (*T.*)

පළ, *n.* war-drum, tabour (*v.* පටහ)

පළ, *a.* known, public, broad

පළ, *vt.* to split, to rend (පළයි)

පළඟ(ග්), *n.* chair, sofa, sitting with legs crossed

පළකර, *vt.* to disclose, to publish, to set or appoint

පළඟ(or ඟ), *n.* grasshopper, chair, sofa, sitting with legs crossed

පළව, *a.* public, published

පළමු, *a.* first, former, before

පළමුදා, *n.* two days before yesterday

පළමුවෙනි, *a.* first, chief

පළල්, *a.* published, spread, broad

පළල(ල්), *n.* breadth, width

පළඳ-ය, *n.* roof, covering. *n.* -සෙනෙවෙළි, shade or covering of a roof, thatch

පළහ, *n.* war-drum, tabour

පළා, *n.* war-drum, shrivelled leaf

පළිගන්, *vt.* to retaliate, to revenge

පළිගහ, *vi.* to express dissatisfaction, to state one's grievance to obtain redress

පළිඟු, *n.* crystal

පළිබෝධ-ය, *n.* obstacle (*P.*)

පළි-ය, *n.* revenge, retaliation, redress. (*T.*)

පළිචෝද-ය, *n.* accusation, fault [පළුව)

පළු, *n.* joint, a tree (*mimusops hexandra*) (*r.*

පළුන(or කා)ස්, *n.* a plant (*uvaria zeylanica*)

පළුබු, *n.* a tree (*hernandia peltata*)

පළුතණ, *n.* club rush (*scirpus cibaris*)

පළුදු-ව, *n.* defect, flaw, damage (*T.*)

පළුපළ, *vt.* to split or cleave into halves

පළුබිඳු-ව, *n.* key ring

පළු-ව, *n.* split or cut half

පළුවිරි, *n.* a tree (*guatteria dulcis*)

පළේ(ල), *n.*=පලන [*n.* -වණ(ස්), brown

පළොල්, *n.* a tree (*stereospermum suaveolens*).

පංගං, *n.* a plant, insult [quetry

පංගාබම්බ(බි), *n.* preparation, arrangement, co-

පංගාර්තු-ව, *n.* preparation, arrangement

පංගුකාර-යා, *n.* partner. shareholder

පංගු-ව, *n.* part, share (*T.*)

පංගුත්තය(-ත්තු), *n.* snare, trap, pitfall, noose

පා(*b.*), *n.* sin, bowl, foot, wooden fork, tree, root of a tree, post, palace, mansion, passage of a text, milk, water, an honorific suffix

පා, *vt.* to display, to show, to put forth(පෑ)

පාක්කුඩම(ම්), *n.* gift, tribute (*T.*)

පාක්ෂික, a. fortnightly, factious

පාක-ය, n. cooking, boiling, ripeness, maturity

පාකොට, *n.* ankle

පාකර, *vi.* to reject, to shun, to float

පාමංජුර(රු), *n.* anklet, *foot* ornament

පාග, *vt.* to trample, to tread (පෑගු)

පාච්චල(ල්), *n.* contempt, disrespect

පාචන-ය, *n.* purging, evacuation of bowels.
n. -රෝග-ය, dysentery [cuations

පාචනවෙ, *vi.* to purge, to have frequent eva-

පාචිත්තිය, *a.* requiring expiation, expiatory (*P.*)

පාට, *n.* colour, tint. *vt.* -කර, to colour, to dye. *vt.* -ගා, to paint, to colour

පාටලී, n. trumpet flower (පළොල්)

පාටලීපුත්‍ර, n.=පැළලුපුර

පාටවැටෙව, *vi.* to show colour, to blush [pupi

පාඨක-යා, n. teacher, lecturer, public reader,

පාඨ-ය, *n.* reading, reciting, passage of a text

පාඨශාලා-ව, *n.* school, college

පාඩ, *n.* mixture of black and white, piebald

පාඩගම(ම්), *n.* ancle-ring worn by women (*T.*)

පාඩම්කර, *vt.* to learn or study a lesson

පාඩම(ම්), *n.* lesson, study of books (*T.*)

පාළු-ව, *n.* deficiency, loss [of a country

පාඬි, *n.* yellowish colour, ako. fish, name

පාණ්ඩව(*b.*), n. descendant of Pa*ndu*

පාණ්ඩිත්‍ය-ය, n. scholarship, profound learning

පාණ්ඩු, *a.* pale or yellowish white. n. name of the father of P*and*avas. n. -වර්ණය white or yellowish white colour, jaundice

පාණ්ඩුකම්බල n. name of *S*akra's stone throne

පාණාතිපාත-ය, *n.* destruction of animal life (*P.*)

පාණිග්‍රහණ-ය, } n. marrying, marriage
පාණිග්‍රහ-ය, }

පාණිතල-ය, *n.* palm of the hand

පාණිනි(*b.*), n. name of a celebrated Sanskrit grammarian. a. පාණිනීය, relating to or composed by P*an*ini; n. grammar of P*an*ini

පාණිමුක්ත-ය, n. missile thrown with the hand

පාණි-ය, n. hand. n. -රුහ-ය, finger-nail

පාත, *a.* low, under. *vt.* -කර, to lower

පාත්ත-යා, *n.* goose (*pl.* පාත්තයෝ. *f.* පාත්තී)

පාත්ති-ය, *n.* bed prepared for planting

පාත්බසි, *vi.* to submit, to yield, to go down

පාත්‍ර-ය, n. cup, vessel or pot in general, alms bowl

පාත-ය, n. descent, fall

පාතාල-ය, n. the last of the seven regions under the earth (peopled by Nagas)

පාදික, a. belonging to the foot

පාද, n. (bo. පාදයෝ) a term ofgreat respect

පාද, vt to clear, to unfold, to explain (පෑදු)

පෑදකොමස-ය, n. anklet

පාදජාලා-ව, n. stockings of net work

පාදඩ-යා, n. vagabond, vagrant

පාදතල-ය, n. sole of the foot

පාදප-ය, n. tree, foot-stool

පාදපරිචාරිකා-ව, n. wife

පාදපීඨ-ය, n. foot-stool [a mountain

පාදමූල-ය, n. sole of the foot, heel, foot of

පාද-ය, n. foot, quarter (fourth part), fourth part of a stanza (a line), part. n. flat-bottomed boat

පාදාඞ්ගුලි-ය, n. toe

පාදාභරණ-ය, n. ornament for the feet

පාදිරි(or ද්‍රි)(b.), n. Christian clergyman (Pg.)

පාදුකා-ව, n. shoe, slipper, circular holeof the water-closet or stool

පාදෝණි-ය, n. boat for holding milk or water

පාදේ(ද), n. flat-bottomed boat, part, quarter

පාදධෝවන, } *n.* washing the feet, place fc
පාදධෝවනය-ය, } washing the feet

පාන්, *n.* bread (*Pg*) (*pl.* of පාන)

පාන්එළි-ය, *n.* lamp-light, a ceremoney performed in honour of gods

පාත්(or ං)කඩ-ය, *n.* lamp-wick, piece of rag

පාන්(or ං)සන්ද(-කදු), *n.* candlestick

පාත්(or ං)විදෙව, *vi.* to pierce into

පාන්තාරකා-ව, *n.* morning star

පාන්සිර-ය, *n.* lamp-wick [the wick burns

පාන්තුඩ(ඩු), *n.* point in a lamp at which

පාන්දර, *n.* day-break, morning [demons

පාන්පූජා-ව, *n.* offering of lights to gods c

පාන්මඩු-ව, *n.* a ceremoney performed in honour of gods (*v.* පාන්එළිය)

පාන්වැටි-ය, *n.* lamp-wick

පාන්වෙව, *vi.* to become morning, to down

පාත්සිළ(ළු), *n.* flame of a lamp

පාන(න්), *n.* lamp, drink, drinking. *prpa.* (from පා) showing, producing [drink

පාන-ය, n. drinking, beverage. *vt.* **-කර,** to

පානාගාර-ය, *n.* tavern

පානීය, a. drinkable. n. water, drink

පාඬුදිය, } *n.* water in which rice has been
පාඬුදියර, } washed

පාප්(*b.*), *n.* Pope (*Pg.*)

පාප්ප, *n.* paultice (*Pg.*)

පාප, a. evil, sinful, wicked, vile, malignant

පාපක, a. bad, sinful, wicked

පාප-ය, n. evil, sin, crime, vice

පාප-යා, n. wretch, sinner, wicked man

පාපි, a. sinful, wicked. n. -යා, sinner

පාපිළු, *n.* rice boiled with milk, milk-rice

පාපියුම(මි), *n.* lotus like foot

පාපිෂ්ඨ, a. most sinful, very wicked

පාපිල්ල(-පිලි), *n.* symbol for ු or ූ attached to a cononant

පාපිස්ස(-පිසුන්), *n.* rug or matting for wiping feet

පාපි(or පී)ස්ස(-පිසි or -පීසි), *n.*=පාපිස්ස

පාපුටු-ව, *n.* footstool

පාපුස්, *n.* slippers (*Pg.*)

පාබලසෙනඟ(or -සෙනග or -සේනා-ව), *n.* army of infantry

පාබලා(ලු), *n.* foot-soldier

පාබිස්ස(-බිසි), *n.*=පාපිස්ස

පාමුද්ද(-මුදු), *n.* bangle for the feet, ring worn by women on the toes

පාමොක්, *a.* chief, principal. n.=ප්‍රාතිමෝක්ෂය

පා-ය, *n.* water, milk, plenty, palace, mansion

පායස-ය, n. rice boiled in milk, milk-rice

පායාස-ය, *n.* (Pali form of පායසය)

පාර්වත, a. being or living on a mountain, mountainous

පාර්වතී, n. name of Durga (born as the daughter of the Himalaya mountain)

පාක්ෂිකත්ව-ය, n. partiality

පාර්ශ්ව-ය, n. side, part, section [(v. පාර්ශ)

පාර, n. way, road, blow, time (pl පාරවල්)

පාරදුරි, vt. to open or construct a road, to get out of the way

පාරග, a. crossing over, profoundly learned

පාරගත, a. crossed, fully or profoundly learned

පාරට්ටු-ව, n. praise, excellence, boasting. vt. -කර, to praise, to flatter, to boast

පාරපහාව, n. whereabouts of a journey

පාරද, n. epithet of Buddha, quicksilver

පාරමිතා-ව, n. perfection, perfection of certain virtues by a Bodhisatva (v. දසපාරමිතා)(P.)

පාරමි(b.), n.=පාරමිතාව (P.)

පාර-ය, n. further or opposite bank (of a river or ocean), further or opposite side of anything, fullest extent, quicksilver

පාරලෞකික, a. relating to the next world

පාරව, vt. to stretch out, to squeeze or hit against a boil (පෑරවූ)

පාරශ, n.=පායශක

පාරසි(or සී or ශී)කය-ය, n. Persia. n.-යා, Persian

පාරසී, n. the Persian language

පාරාජිකා-ව, n. unpardonable sin (P.)

පාරාව(or ව)තයා, n. pigeon, dove

පාරාවළල්ල(-වළලු), n. short curved cudgel

පාරි, vt. to burst, to split, to rend(පාරූ)

පාරිජාත(or -ජාතක)(b.), n. a tree in *Sakra's* heaven, coral tree

පාරිද[illegible]යා, n. overseer

පාරිභෝගික, a. used, employed (*P.*)

පාරිෂද්‍ය-ය, } n. assembly, retinue, spectators
පාරිෂද-ය, }

පරිහාරික, a. taking, seizing, surrounding, n. -යා, maker of gardlands

පාරිහාර්‍ය-ය, n. bracelet, taking, sezing

පාරුගල(ල්), n. subsoil

පාරුපණ-ය, n. dressing, putting on a garment or cloth (*P.*)

පාරුව, n. flat-bottomed boat, barge, pada-boat

පාරුෂ්‍ය-ය, n. harshness, abuse, insult

පාමෙරන, *vi.* to go on road, to follow, to go after

පාල, n. protecting, guarding (*v.* පාලයා)

පාලන-ය, n. protecting, fostering

පාලම්(ම), n. bridge (*T.*)

පාලක-යා, n. protector, guardian, keeper

පාලංකඩ, n. small bridge

පාලි(or ළි), n. language of the Buddhist texts, Magadhi (*v.* පාලිය) [a text

පාලි-ය, n. line, row, sacred text, passage in

පාවචන-ය, *n.* word of Buddha, holy scriptures (*P.*)

පාවට්ටා, *n.* a plant (*adhatoda vasica* or *justicia adhenatoda*; *pavetta indica*: ආඩාතෝඩා)

පාවර්, *n.* thrashing floor, place where oxen tread out the corn

පාවලල්ල(-වලලු), *n.* anklet

පාවාගනි, *vt.* to take in charge, to marry

පාවාඩ-ය, *n.* cloth spread on the ground to walk upon (a mark of honour to a person)

පාවාදෙ, *vt.* to give in charge, to give in marriage [(*T.*)

පාවිච්චි-ය, *n.* use, practice. *vt.* -කර, to use

පාවිට, *n.* extremity of foot

පාවි, *pp.* (from පාවෙ) having floated

පාමුල, *n.* lower portion of land, foot (of a mountain)

පාවෙ, *vi.* to float, to drift (පාවුණු)

පාශ-ය, n. snare, trap or net (for catching birds and beasts), fetter

පාෂාණ්ඩ-යා, n. heretic, unbeliever

පාෂාණ-ය, n. stone

පාස්කු(or කා)-ව, *n.* Easter (*Pg.*)

පාස්ස, *vt.* to solder, to weld (පෑස්සු)

පාසකිය, *vt.* to threaten, to complain of bad treatment

පාෂ-ය, *n.*=පාෂාණ

පාසලඹ(ං), *n.* tinkling ring for the foot and [ankles

පාසා, *part.* from one to another, successively

පාෂාණං, *n.* arsenic

පාසි, *vt.*=පාහි(පැස්ම)

පාසු, *a.* easy, improved in health

පාසුස්, *a.* having broken or cut feet

පාසු-ව, *n.* facility, ease, improvement in health [recovery

පාහ, *vt.*=පහ (පැහැස්සු)

පාහි, *vt.* to cleanse by pounding, to cut(පැහැස්සු)

පාහේ, *part.* somewhat, like

පාළ, *a.* published, public

පාළි, *n.*=පාලි

පාළු, *a.* abandoned or left unoccupied for a time, uncultivated, waste

පාළුකර, *vt.* to lay desolate, to lay waste

පාළු-ව, *n.* state of being abandoned, waste, desolation

පාං, *n.* bread (*Pg.*). *n.* -ගෙඩි-ය, loaf

පාංශු(or සු)-ව, n. dust, crumbling soil, clay

පාංසුකූල-ය, n. rag from a dust heap or burial place, cloth offered to monks at a funeral

පැකස්, *n.* mud, mire

පැකි(*b.*), *n.* fruit

පැකිලි(or ලු)ම(ම්), *n.* (*yo.* පැකිලෙ) stumbling, [striking against

පැකිළෙ, vi. to stumble, to strike against (පැ
පැකු, n. mud, mire (r. පැකුණ) [කුදූතු)
පැකිරි(ලි), n. =පැකිලීම
පැකිරි(ති), n. young animal
පැඟිරි(රි), n. zest or juice of the rind of oran-
පැඟිරි, n.
ges, lime, etc. a. sour, acid
පැඟිරිතෙල්, n. citronella oil
පැඟිරියා, n. citronella grass [f. පැසද්ධි)
පැටියා, n. little one, child, boy (pl. පැංචෝ,
පැටිලි(වි), n. concealing, disappearance
පැටුම(ම), n. young of any animal
පැටවා, n.
පැටවීම(-වූම), n. loading, freighting, burden
පැටිම(or මුම)(ම), n. =පැටවිල්ල; concealment, vanishing
පැටුම(ඩ), n. commencement, concealment [සිතෙන්)
පැටික්කි, n. girl, lass, young woman (pl. පැටික
පැටිකාවිලේ, n.=ටෙපනිසාවිලේ [මෙන්, පැටවි
පැටිය, n. young of any animal (pl. පැටි
පැටිනුම(මි), n. concealment, vanishing
පැටි, n.=පැටික්කි
පැණිබා(පැණි), n. ako. small insect (v. පඹි)
පැඬි(or ඩි)ලි, n. white colour, pale or yellow colour

පැණ, n. wisdom, hood of the cobra. n. -ඇස, mind's eye, wisdom. a. -වත්, wise, learned. n. -වතා(ත්), wise man, learned man

පැණවීම(ම්), *n.* (*go.* පණවා), enacting, makin

පැණතර, *a.* very wise or learned. *n.* -ා, very wise man

පැණි, *n.* treacle, syrup

පැණිදොඩම(ම්), *n.* common (sweet) orange

පැණිරස(or ය), *n.* sweet flavour, sweetmeat

පැණිරසැතිලිය, *n.*=වැල්මි

පැණෙ, *vi.* to appear, to be visible (පැණුණු)

පැත්ත(පැති), *n.* side, direction, fence

පැතලි, *a.* flat, even

පැති, *n.* (*bo.* පැත්ත)

පැතිනි, *n.*=පත්නි

පැතිර, *pp.* spread, published

පැතිරෙ, *vi.* to spread, to be diffused(පැ ර ණු)

පැතී(or තු)ම(ම්), *n.* (*go.* පතා), hoping, wishing

පැතිරීම(ම්),
පැතුරුම(ම්), } *n.* (*go.* පැතිරේ); spreading, diffusion

පැද්දී, *n.* Paduva woman (*f.* of පදුවා)

පැද්දී(or දු)ම(ම්), *n.* (*go.* පද්ද and පැද්දෙ) causing to row, causing to move forwards and backwards

පැදකුණු(*b.*), *n.*=ප්‍රදක්ෂිණාව

පැදි, *a.* eastern. *ppa.* (from පදි)

පැදී(or දු)ම(ම්), *n.* (*go.* පදි) rowing, swinging

පැදුම්, *a.* eastern. *n.* cloud. *n.* -දිස්පත්, -දිස්සාමි(*b.*), epithet of Sakra

පැස්දිග(පු or ත්), n. eastern quarter, east

පැස්දෙකුව(b.), } n. cloud
පැස්රය,

පැදුර(රු), n. mat

පැන්(b.), n. water [for travellers

පැන්තැලි-ය, n. water pot set on the roadside

පැන්නා(පෑන්න), n. ako. fish (pl. පෑන්නෝ cf. v. පනී)

පැන්නූ, ppa. driven away, caused to jump over

පැස්සම, n. thirst

පැස්සාල(ලේ), n. place attached to a water-closet and used by Buddhist priests for doing the washing and discharge of urine .

පැලෑල්ල(ල්ලේ), } n. cup or drinking vessel
පැලෑම(කො-ම),

පැනි-ය, n. penny (E.)

පැන්සල(ල්, n. pencil (E.)

පැන(b.), n. question, full ?pot, water. pp. (from පනී) having leaped or jumped (v. පැන)

පැනල්, n. flannel (E.)

පැති-යා, n. thirsty man (v. පැසී)

පැනිත්ත(ත්ති), n. drop of water

පැනීම(මේ), n. (go. පනී) jumping, leaping [ඩහාං)

පැලිලි-ය, n. a plant (mollugo cerviana: පුසලා)

පැපොල්, n. papaw (Pg.)

පැමිණ, pp. (from පැමිණෙන) having arrived

පැමිණි, ppa. (පැමිණෙන), arrived, happened

පැමිණිකාය(යෝ), *n.* a term of respect (his, her or your honour)

පැමිණිල්ල(-ණිලි), *n.* complaint, lawsuit

පැමිණිලිකර, *vt.* to complain, to prosecute

පැමිණිලිකා -රයා, *n.* plaintiff, complainant (*pl.* පැමිණිලිකාරයෝ)

[pening

පැමිණීම(මි), *n.* (*go.* පැමිණ) arrival, hap-

පැමිණෙනවා, *vi.* to arrive, to happen

පැය, *n.* Sinhalese hour (=24 minutes)

පැර, *up.*=පර

පැරකුම(මි), *n.* might, heroism, dignity

පැරණි, *a.* old, ancient

පැරද, *pp.* (from පරදී) having been defeated

පැරදීම(මි), *n.* (*go.* පරදී) defeat [රදනු)

පැරෙද, *vi.* to be overcome or defeated (පැ

පැරප(පේ), *n.* basket for catching fish (කරක් ගොඩිය)

[quering

පැරයීම(or යුම(මි), *n.* (*go.* පරය) defeating, con-

පැරැද්දූ, *ppa.* (from පරද්දූ) defeated, overcome

පැරැටි-යා, *n.* ako. small fish

පැරුම(මි), *n.*=පාරමිතා

පැල, *n.* (*bo.* පල)

පැල්කුලි, *n.* wages in paddy for the man taking care of the crops, door of a hut

පැලුම(පැලීම), *n.* (*go.* පල, පැලෙ) bursting, cleft

පැල්රකී, *it.* to watch the rice fields (පැල්රැක්ක)

පැල්ලම(ම්), *n.* spot, blot, stain

පැල(ල්), *n.* small hut, watch hut, hovel, west

පැලගැටි-ටා, *n.*=පලංසැටිය

පැලකී, *ppa.* rejected, left

පැලදිග(ගු), *n.* west quarter

පැලදිගුහිමි-යා, *n.* regent of the west, Varu*n*a

පැලඳගනී, *vt.* to dress one's self, to put on ornaments [ment, dress

පැලඳි(or ඳු)ම(ම්), *n.* (*go.* පලඳී) decorating, ornament, dress

පැලඹේ, *vi.* to appear gay, to behave proudly (පැලඹුණු)

පැලනෙ, *vi.* to burn (පැලුණු)

පැලා, *ppa.*=පලා, having fled [work, tat

පැලෑල්ල(පැලෑලි), *n.* blind of open wicker-work, tat

පැලෑන(න්), *n.* figure of survey (*E.*)

පැවිතව, *vi.* to descend (පැවතුණා)

පැවති(or තු)ම(ම්), *n.*=පැවැත්ම [(පැවතුණු)

පැවතෙ, *vi.* to last, to remain, to continue (පැවතුණු)

පැවරීම(ම්), *n.* (*go.* පවර) inviting, entrusting, ordering

පැවසී(or සු)ම(ම්), *n.* (*go.* පවස) saying, narrating

පැවසූ, *ppa.* (from පවස), said, spoken

පැවිජි, *n.* (old form of පැවිදි)

පැවිද්ද(පැවිදි), *n.*=ප්‍රව්‍රජ්‍යාව

පැවැත්ත(පැවති), *n.* custom, habit, practice

පැවැත්ම(පැවතුම්), *n.* (*go.* පැවතෙන) lasting, continuing, existence

පැවැත්වීම(ම්), *n.* (*go.* පවත්වන) observing, maintaining, causing to exist

පැස්බරා(රා), *n.* unfledged bird, ostrich

පැස්ස(පැසි), *n.* curry of pungent spices

පැස(ස්), *n.* ratan basket, basket used for putting in the fishing bait or for squeezing oil, etc.

පැසූ, *pp.* (from පාසි o.. පාසි) having prun′ or cut. *a.* past

පැසව, *vt.* to cook, to boil, to mature artificially. *vi.* to suppurate, to come to a head (පැසෙවු)

පැසසි(or සු)ම(මි), *n.* (*go.* පසසන) praising, praise

පැසි, *a.* last, western (*r.* පශ්චිම). *n.*=පැස්ස

පැසීම(මි), *n.* (*go.* පැසෙන) ripening, being cooked or boiled

පැසිබත(ත්), *n.* rice prepared from small particles of broken rice

පැසුම(ම්), *n.* past time, ripening (*v.* පැසීම)

පැසුනි, *ad.* after, behind, again (පැසුනු)

පැසෙන, *vi.* to ripen, to mature, to be cooked

පැහැ, *n.* colour, ray of light, ratan basket (*v.* පැස)

පැහැ, *ij.* go away! exclamation of contempt

පැහැද, *pp.* (from පහදි) being pleased

පැහැදිලි, *a.* clear, limpid, plain

පැහැදී(or දු)ම(ී), *n.* (*go.* පහදී or පැහැදේ)

පැහැදෙ, *vi.* to be clear, to be pleased or satisfied with (පැහැදුනු)

පැහැපත්, *a.* shining, bright

පැහැ-ය, *n.* colour, tint

පැහැර, *pp.* (from පහරි) having struck or left off, having shunned, having wrested

පැහැරහරි, *vi.* to evade, to neglect

පැහැරගනී, *vt.* to take by force, to plunder

පැහැරී(or රු)ම(ී), *n.* (*go.* පහර), evacuation by stool, striking, taking by force [welded

පැහැසී, *ppa.* (from පසස) connected, joined,

පෑසී(or සු)ම(ී), *n.* *go.* පාස)joining, welding, comparing

පැසි, *n.*= පැස and පෑසි

පැසිච්ච, *ppa.* (from පැසෙ)ripe, mature, cooked

පැළ. *n.*= පෑළ; suffering. *a.* young

පැළ-ය, *n.* plant, shrub

පැළවේ, *vi.*to sprout, to shoot out, to germinate

පැළුණු, *ppa.* (from පැළෙස), split, rent

පැළුම(ී), *n.* (from පැළෙස), splitting, rending

පැළෙස, *vi.* to split, to rend (පැළුණේ)

පැළි, *ppa.* (from පළෙ) split, rent

පැළී(or ළු)ම(ී), *n.* (*go.* පළෙ) splitting, rending

පැළෙ, *vi.* to burst, to split, to rend (පැළුණු)
පැ, *n.* (*bo.* පැය) cup, hour, colour
පැගෙ, *vi.* to be trampled on (පැගුණු)
පා, *pp.* (from පා) having shown or produced
පැතැටි-ය, *n.* 'hour-cup', native water-clock
පැහැදෙ, *vi.* to become clear (as water), to be pleased (පැහැදුණු)
පෑන(න්), *n.* pen (*E.*)
පෑන මස්සි පිහිය(ය), *n.* pocket knife (*D.*)
පැමැටි, *n.* last and coloured clay coating [of a wall
පැ-ය, *n.* colour, brightness
පැරෙ, *vi.* to be hurt or touched (පැරුණු)
පැල, *n.* west, backside
පැලදිග ය or ව, } *n.* west quarter
පැලමඬල(ල), }
පැලදොර, *n.* door opening to the west, back- [door
පැස්සෙ, } *vi.* to be welded or united, to agree
පැහෙ, } (පැස්සුණු, පැහුණු)
පැළ, *n.* measure equal to ten kuru*n*is
පෑළවිය, *n.* the first day of a lunar fortnight
පි, *up.* near to, on
පිත්මලී, *n.* a plant (*trigonella corniculata*)
පික(*b.*), n. Indian cuckoo (*cuculus micropterus*)
පිකදප්(*b.*), *n.* epithet of Indian Cupid
පිකාසි(සි), *n.* pick-axe, ako. hoe (*Pg.*)
පිකා-කා, n.=පික

පිඟු(or ගු)ර(රැ), *n.* figure (of survey); title plan (*Pg.*)
පිඟන්කෝප්ප(*b.*), *n.* plates and cups, crockery
පිඟන්මැටි, *n.* pipe clay
පිඟාන(න්), *n.* plate (*pl.* පිඟාන්, පිඟන්)
පිළිසි, *a.* squinting, squint-eyed
පිඟු, *a.* tawny
පිඟුකෙස්(*b.*), *n.* epithet of *Siva*
පිඟුල්, *a.* tawny. *n.* right nostril
පිඟුවණ(න්), *n.* tawny colour
පිඞ්ගල, a. tawny, yellow red
පිච්ච, *n.* a species of jasmine
පිච්චි(or චු)ම(මේ), *n.* (*go.* පුච්ච) burning
පිච්ඡ-ය, n. feather of a tail, peacock's tail
පිඤ්ච(පුඤ්චි), *n.* little thing (*T.*)
පිඤ්ඡ-ය, *n.* peacock's tail (*P.*)
පිට්ටනි-ය, *n.* meadow, lawn (*T.*)
පිට්ටු-ව, *n.* meal-cake boiled by steam (*T.*)
පිට, *a.* outward, outside. *n.* back; page (*pl* පිටු, පිටවල්)
පිටඇට-ය, *n.* back bone
පිටඇල, *n.* canal round a field
පිටක-ය, n. box, basket, treasury, division of Buddhist scriptures
පිටකත්‍ර-ය, *n.* name of the Buddhist scriptures, (consisting of the three Pitakas or divisions: විනයපිටකය, සූත්‍රපිටකය, and අභිධර්මපිටකය)

පිටකොටු-ව, *n.* suburb, pettah

පිටකොන්ද(-කොඳු), *n.* spine

පිටගම(ම්), *n.* village other than one's own

පිටගැස්ම, *n.* tetanus

පිටත්, *a.* outside, beyond

පිටත්කර, *vt.* to set off (another) on a journey

පිටත්වෙ, *vi.* to depart, to set off (on a journey)

පිටත(ත්), *n.* outside, abroad

පිටදම, *vt.* to throw out, to expel

පිටනුවර, *n.* suburbs of a city

පිටපට-ට, *n.* = [illegible]මුඛය [translate, to banish

පිටපත්කර, *vt.* to transcribe, to copy, to

පිටපත(ත්), *n.* copy, version, translation

පිටපාර, *n.* outer path, way different from that leading to one's house

පිටපිට, *ad.* over and over, consecutively

පිටමංකර, *vt.* to cast out, to turn out

පිටමුල(ල්), *n.* hip [(*pl.* පිටරටවල්)

පිටරට, *n.* distant country, foreign country

පිටල්ල(පිටලු), *n.* basket, cupboard

පිටලිය, *vt.* to superscribe, to address

පිටවක්කා, *n.* a plant (*phyllanthus niruri*)

පිටවස(ස්), *n.* outside, back part

පිටවහල්කර, *vt.* to banish, to deport

පිටවාංඡත්(ත්), *n.* spill-water, canal round a field

පිටවෙ, *vi.* to go out, to get out

පිටස්තර, *a.* external, outward
පිටසක්වළ, *n.* out-lying world
පිටසොලී, *n.* parsley (*D.*)
පිටදඹුවලා, *n.* a plant (*hedyotis nitida*)
පිටංගෙණ, *n.* outside, out of doors
පිටාන්තර, *a.* = පිටස්තර [garden
පිටාවි, *n.* ditch or channel outside a field or
පිටාමර, *n.* overflowing of a stream, abundance
or rain water [illegitimate child
පිටි(*b.*), *n.* meal, flour, powder, lawn, outside,
පිටිඅත(or ල්)ල(-තල), *n.* back of the hand
පිටිකර, *n.* hind part of the neck, nape
පිටිකර, *vt.* to grind or pound into meal
පිටින(or නා)ල, *n.* hands (put) behind back
පිටින්, *n.* from without, having, with
පිටිපතුල(ල්), *n.* instep
පිටිපස්ස(-පස), *n.* behind the back
පිටිපස. *n.* back part, behind
පිටිපා, *n.* to turn the back (පිටිපෑ)
පිටි-ය, *n.* plane tract of ground, meadow
පිටිහැඳ(ල්), *n.* help, favour, ejecting (*v.* පි
වැහැලුකාර)
පිටිසර, *n.* rural district, interior place
පිටු, *n.* pages (*v.* පි-), multitude
පිඩ, *n.* ball, round lump (*pl.* පිඩු)
පිඩැල්ල(පිඩලි), *n.* turf, clod

පිඩු(*b.*), *n.* ball, multitude, nave (of wheel), alms (*v.* පිණ්ඩය)

පිඩුල, *n.* mango fruit

පිඩුව, *pp.* having assembled, being collected

පිණ්ඩපාත-ය, n. food received in the alms-bowl of a Buddhist monk when he goes begging. vt. -යෑ, to beg alms

පිණ්ඩපාතික(*b.*), n. monk who lives on alms obtained by begging

පිණ්ඩ-ය, n. round mass, ball, clod, ball or lump of rice, food, alms, multitude, sum, total

පින(ත්), *n.* religious or moral merit, charity, fullness

පින, *vi.* to rejoice, to be satisfied with (පිනූ)

පිනව, *vt.* to cause to rejoice, to please, to satisfy (පිනෙවු) [joy

පිනවීම or වුම, *n.* (*go.* පිනවු) pleasing, satisfying,

පිනී, *pp.* (from පින) being pleased or satisfied

පිනැති(or ත්), *a.* meritorious, fortunate

පිනි, *a.* very sweet. *n.* dew [*triseta*)

පිනිතුතණ, *n.* a species of grass (*eriachne*

පිනිදි-ය, *n.* nectar of flowers, scented water, dew

පිණිපා(*b.*), moon, elephant, fish, hare, salutation, obeisance (*v.* ප්‍රණිපාතය)

පිණිබෑරෑ, *n.* a tree (*eugeria mooniana*)

පිණිබෑරෑතණ, *n.* vernal grass (*anthisteria tremula*)

පිණිබා, *vi.* to fall as dew (පිණිබෑ)

පිණිමුවා(ව), *n.* ako. deer, raindeer

පිණිස, *prep.* for the purpose of, for

පිණි(or ණු)ම(මි) *n.* (*go.* පිණ) pleasing, satisfying

පිණු, *a.* full, complete

පිත(*b.*), *n.* son, bile

පිත්ත(පිති), *n.* stalk of a branch of the palm kind

පිත්තකාමලා-ව, n. jaundice (කොංගමාලය)

පිත්තජ්වර-ය, n. bilious fever

පිත්ත-ය, n. bile, bilious humour

පිතෘපස්ථාන-, n. attendance on father

පිත්තල, n. brass. n. -මල, verdigris

පිත(ත්), *n.* bile, bilious humour

පිතාමහ, n. paternal grandfather, epithet of Brahma

පිතුරු(*b.*), *n.* joy, delight

පිතෘ(*b.*), n. father. a. -ක, paternal, ancestral

පිතෘඝාතක-යා, n. parricide

පිතෘඍද්ධි-ය, n. father's prosperity

පිදේනිල්ල(-ඩිල්ලි), *n.* offering to a deity or demon, land offered by individuals to temples

පිදු(දූ)ම(මි), *n.* (*go.* පුද) offering, adoration

පිදුරු, *n.* straw, dried stalk of the paddy

පිදූ, *ppa.* (from පුද) offered, adored

පිදේන්න(පිංදෙනි), *n.* offering made to demons
පිධාන-ය, n. covering, lid
පින්, *n.* (*bo.* පිං). *vt.* -කර, to do meritorious [acts
පින්කම(ම්), *n.* doing merit, Buddhist festiva
පින්කිරිය, *n.* religious meritorious act
පින්තාරු-ව, *n.* painting. *vt.* -කර, to paint(*Pg.*)
පින්තාලි-ය, *n.* water-pot set on the road side for free use of the passers
පින්තූර-ය, *n.* painting, picture (*Pg.*)
පින්න, *n.* a plant (*clerodendron infortunatum*), dew (*v.* පිණි)
පින්චි-ය, *n.* pension
පින්පෙත්, *n.* religious merit to be tranfer to deceased [illegible]
පින්වත්, *a.* lucky, happy, possessed of merit
පින්සෙණ්ඩු-ව, *n.* entreaty, begging. *vi.* -වෙ, to entreat, to beg. *n.* -ලී, soft-wood
පිනාක-ය, n. the bow of *Siva*, trident
පිනුම(ම්), *n.* (*go.* පනී) leaping, somersault. *vi.* පිනුම්පනී, to leap
පිප්ප-යා, *n.* man bloated and pale (a sign [of jaundice)
පිප්පල, n. holy fig-tree (*ficus religiosa:* බොගහ)
පිප්පලි, n. long pepper (තිප්පලී)
පිප්පෙ, *vi.* to be puffed (පිප්පුනු)
පිපාස-ය, n. thirst, desire to drink
පිපාසාතුර, a. oppressed with thirst

[illegible], a. thirty

පිපි, ppa. (from පිපෙනවා) expanded, full-blown

පිපුල, ppa.=පිපි

පිපිඤ්ඤා, n. cucumber (Pg.)

පිපාසක(b.), n. enemy, adversary

පිපි-කා, n. ant

පිපිරෙන, vi. to crack, to burst, to rage (පුපුරනවා)

පිපිරි, a. bloated and pale

පිපී, pp. (from පිපෙනවා) having expanded

පිපීම(ම), n. (go. පිපෙනවා) expanding, opening

පිපීලිකා-වා, n. ant [puffed

පිපුණු, ppa. (from පිපෙනවා) expanded, blown,

පිපෙනවා, vi. to expand, to blow (as a flower), to puff up (පුපුලා)

පිබිදෙනවා, vi. to awake (පිබිදුණු)

පිඹිනවා, vt. to blow, to hiss (as a serpent)(පිඹිම)

පිඹීම or පිඹුම(ම), n. (go. පිඹීම) blowing, hissing

පිඹුර(රා), n. (ifo. පිඹුරා)

පිඹුරා(රා), n. rock snake (python molurus)

පිම්බෙනවා, vi. to be expanded, to puff up (පිම්බුණු)

පිම්ම(ම), n. (from පනි) leap, somersault. vi. පිම්මෙනවා, to gallop

පිය(b.), n. feather, a tree (r. පියාසාල), father, frankincense, woman, husband, eyelid, foot, footmark. a. pleasing, beloved, paternal

පිය, *vt.* to shut, to cover, to close, to leave (පියා, පිවු)

පියඋරුම-ය, *n.* paternal inheritance

පියකර(or රු), *a.* pleasing, agreeable

පියකිරිල්ල, *n.* a plant (*hydrolea zeylanica*)

පියගඳ, *n.* agreeable smell, perfume

පියගැට, *n.* ladder, step of a ladder, stair

පියඟු, *n.*=ප්‍රියඞ්ගු

පියසම(*b.*), *n.* husband, wife

පියොද, *vt.* to use, to employ, to order (පියෙදූ)

පියොදව, *vt.*=පියොදම

පියොදුක්‍රියා, *n.* causative verb

පියොදුම(ව), *n.* (*go.* පියෝ..) ordering, employing

පියන(*b.*), *n.* lid, rice-field. *r.* -පත, lid, cover

පියවනවා, *vt.* to close, to shut

පියස(ත්), *n.* cover, lid (*c.* පිය)

පියසඟා(*b.*), *n.* wife, woman

පියාපත්, *n.* wing of a bird

පියපස(ස), *n.* dust which adheres to the feet when walking

පියපෝරු-ව, *n.* foot board, footstool

පියබ, *a.* skilful, clever

පියබඳ, *n.* wife, agreeable woman

පියඹ, *n.* agreeable wife, sexual intercourse

පියමන, *n.*=පියාමන

පියොවුරු( ), *n.* breast of a woman, thick cloud

පියයුරුරස, *n.* breast milk

පියර, *n.*=පියවර

පිය(or යා)ව්‍යා, *n.*=පියායාන

පියරැව(වි), *n.* pleasing tone, agreeable voice. *vt.* පියරැවිදෙනු, to sing delightfully

පියල්(*b.*), *n.* strong man, a tree (කොබාර)

පියල්ල(පියළ්, පියලි), *n.* piece of cloth half (of anything globular). drinking vessed

පියලි(*b.*), *n.* (*v.* පියල්ල). *vt.* -කර, to reduce any globular seed into their constituent halves

පියව, *vt.* to cause to be shut (පියෙවු)

පියවර, *n.* foot step, impression of the foot

පියවරල(*b.*), *n.* fish [serves as a flower-alter

පියවසාව, *n.* that part of a dagoba which

පියවි(*b.*), *n.* nature, natural form, uninflected word. *a.* natural [(සාමාන්‍ය)

පියවිල්ල(-වලි), *n.* cloth spread to pass upon

පියවීම(මි), *n* (*ge.* පියවම) causing to be shut

පියවුර(රු), *n.* පියයුර [(as an account)

පියවෙනු, *vi.* to be closed or shut, to satisfy

පියස්ස(පියසි), *n.* roof of a house

පියස(ස්), *n.* region, house or hut made of leaves, neighbourhood

පිසස, *vt.* to announce, to publish (පළකර)

පියසස(ළ) *n.* foot mark

පියසි(l.), n. woolen cloth, carpet,

පියළු, ppa. (from පියළ) announced, published

පියමගර, n. foot-path

පියා(ය), n. father, wing or feather of a bird, a tree (පියාගස)

පියා, pp. (from පියන) having left

පියාගස, n. a tree (*sarcocephelus cordatus*)

පියාණන්දෑ,
පියාණෝ(ණෝ), } n. father (*resp.*)

පියාපත(ය), n. feather, wing

පියාබිඳි, a. having broken wings

පියාඹයි, vi. to fly (පියෑඹි)

පියාලෙ, n. a tree (v. පියල්)

පියාසර, n. flying. vi. -කරි, to fly

පියවූ(or යූ), pp. (from පියන) removed, shunned, covered, shut

පියුන්(b.), n. peon (*E.*)

පියුම(b.), f. epithet of *Sri* Kanta (goddess of prosperity and wife of Vishnu), lotus, covering, removing, one of the nine treasures of Kuvera

පියුම්සාලේ(b.), n. epithet of *Sri* Kantha (Lakshmi)

පියුම්කේසරය, n. pistil of the lotus

පියුම්ගැබ, n. inner cavity of a lotus bud, epithet of Brahma

පියුම්කොමුළු-ව, n.=පියුම්කේසර

[illegible]*b*, *n.* epithet of Vishnu

[illegible]ස, *n.* epithet of Indian Cupid

පියුම්නැබ(*b*), *n.* epithet of Vishnu

පියුම්නිල, *n.* epithet of *Sri Kantha*

පියුම්නෙත්(*b.*), *n.* epithet of Vishnu

පියුම්පණ(*b.*), *n.* epithet of Brahma

පියුම්පෙත්ත(-පෙත), *n.* petal of the lotus

පියුම්මී, *n.* nectar or honey of the lotus flower

පියුම්යොන්(*b.*), *n.* epithet of Brahma

පියුම්රා,
පියුම්රැමිණ(-ණි), } *n.* ruby

පියුම(මි), *n.* lotus (*nelumbium speciosum*)

පියුම්බඳ(*b.*), *n.* sun

පියුම්බඹ, *n.* epithet of Sri *Kanta*

පියුම්ගබ(*b.*), *n.* epithet of Brahma

පියුම්විල, *n.* lotus-pond

පියුම්වැල, *n.* collection of lotus flowers

පියෙවු; *ppa.* (from පියවු) removed, shunned, caused to be shut

පියෙස(ස්), *n.* region, district, court-yard

පියෙත්, *n.* effort, contrivance, device, means

පිරවිඑ-ය, *n.* dislocation, confused state

පිරළිල්ල(-ළි),
පිරවි(or වු)ම(මි), } *n.* (*go.* පුරම) filling up, bulging out

පිරි(*b.*), *n.* ditch, *a.* filled, full, *up.* round, about

පිරික්සා, *pp.* (from පිරික්සය) having examined or inquired into

පිරිකම(ම්), *n.* decoration, adorning, whitewashing

පිරිකර, *n.* requisite, utensil

පිරිකැපු, *ppa.* (from පිරිකපා), divided, apart

පිරිකිදෑලේ, *n.* fricassee (*D.*)

පිරිකුඹ(ඹු), *n.*=පුස්තාලය

පිරිවෙළු, *a.* encircled, surrounded

පිරිතා, } *n.* protection, recitation of certain
පිරිත(ත්), } stanzas to ward off the influence
of evil spirits

පිරිනැමිලි(*b.*), } *n.* prayer, request
පිරිනැමුම(මු), }

පිරිදෙවුම(ම), *n.* lamentation, wailing

පිරිනම, *vt.* set apart (පිරිනැමු)

පිරිනිව, *vi.*=පිරිනිවන්පා(පිරිනිවි) [(as a Buddha)

පිරිනිවන්පා, *vi.* to expire, to become extinct

පිරිනිවීම(ම්), *n.* (*go.* පිරිනිවි) extinction

පිරිපත(ත්), *n.* danger, calamity

පිරිපයන, *prp.* (from පිරිපය) filling, completing

පිරිපුන්, *a.* quite full, content

පිරිබඩ, *n.* besmearing, rubbing, cleaning

පිරිබුන්, *a.* destroyed, exterminated

පිරිමඩ, *ppa.* rubbed (*v.* පිරිමදි

පිරිමසි, *vt.*=පිරිමදී (පිරිමැඩ

පිරිමදී, *vt.* to rub, to stroke (පිරිමැද්ද)

පිරිමස(or ස), *vt.* to economize, to comply (even scantily), to satisfy meanly (පිරිමැසූ)

පිරිමැඩි(or ඳී)ම(ම්), *n.* (*go.* පිරිමඩි, පිරිමදි) rubbing, stroking

පිරිමැස්ම,
පිරිමැසි(or සි)ල්ල(-සිලි, සිලි),
පිරිමැසී(or සී)ම(ම්), } *n.* (*go.* පිරිමස) economy, complying meagrely

පිරිමි-යා, *n.* male, man

පිරිය, *n.* delight, pleasure, love, ditch, moat

පිරියත(ය), *n.* end, completion

පිරිනම(ම්), *n.*=පිරිනැම

පිරිස(or සො)ස්ම,
පිරිස(or සො)ය(ය්), } *n.* seeking, searching

පිරිව, *vt.* to read, to say, to mutter (පිරිවූ)

පිරිවට-යා, *n.*=පිරැවටිය

පිරිවර, *vt.* to surround (පිරිවැරූ)

පිරිවර, *n.* retinue, attendants

පිරිවැති(*b.*), *n.* turning round, changing, surrounding

පිරිවැදෑ(-වැදි), *n.*=පරිබ්‍රාජකයා

පිරිවැස්ස(-වැසි, වැසි), *n.* basket made of leaves

පිරිවෙණ(ය), *n.*=පරිවේණය

පිරිමඩල(ය), *n.* disc of the sun or moon; basket made of leaves

පිරිස(ය), *n.* retinue, suite, practice

පිරිසඳ, *n.* full moon

පිරිසිදු, *a.* pure, clean

පිරිසිඳි, *vt.* to cut off, to separate, to divide, to ascertain

පිරිසි(or සී)ඳ(ඳු), *n.*=පරිච්ඡේදම

පිච්ඡින්, *a.* cut off, divided, ascertained, limited

පිපීක, *n.*—පිපීලිකාව

පිරිහීම(ම), *n.* (*go.* පිරිහෙන) decaying, declining

පිරිහුණු(or ණ), *ppl.* (from පිරිහෙන) lost, wasted, declined

පිරිහ, *vi.* to consume, to decline

පිරිහෙළ, *vt.* to lower, to scorn

පිරිහෙළී(or ළි)ම(ම්), *n.* (*go.* පිරිහෙළන) lowering, scorning

පිරී, *pp.* (from පිරෙ)=filled, full

පිරුණු, *ppl.* (from පිරෙ) filled, completed

පිරුව, *vt.* to say, to recite (පිරුවූ)

පිරුවට-ය, *n.* cloth, cloth or dress lent by a washerman

පිරුළු(ළ), *n.* answer, reply

පිරෙ, *vi.* to be filled or become full (පිරුණු)

පිල්(*b.*), *n.* flower, feather, tail of a peacock

පිල්ඇසුද්(*b.*), *n.* peacock

පිල්කලප්(*b.*), } *n.* cluster of feathers, pea-
පිල්කලඹ(or ම), } cock's tail

පිල්බර(*b.*), *n.* peacock, peacock's tail

පිල(පිළ), *n.* branch, wing or feather of a peacock, testicles, fruit, vowel symbol

පිලුම(ම), *n.* vowel symbol

පිලාව, *n.* outrigger, mound in a swamp

පිල්ලි-ය, *n.* sorcery, a magical contrivance to do harm (*T.*)

පිල්ලුම(ම), *n.* distance a pingo bearer can carry his load without resting

පිල්වැල්ල(-වැලු), *n.* tail of a bird

පිළ, *n.* a tree (*tephrosia purpurea*) (*v.* පිළ)

පිළන්ධන-ය, *n.* wearing or putting on an ornament, ornament (*P.*)

පිලා-ව, *n.* a very small boat

පිලි, *n.* (*ba.* පිල්ල)

පිලිසමෝල(ලු), *n.* iron-ringed pestle

පිලිස්සෙන, *vi.* to burn (පිලිස්සුණු) [scorched

පිලිසි, *ppa.* (from පිලිස්සෙනෙ=පිලිසෙනෙ) burnt,

පිව, *vt.* if drunk. පිවමනා=fit for drinking

පිවිසි, *a.* entered into, arrived

පිවිතුරු, *a.* pure clean. *n.*(*b.*), pleasure, arrow-grass (*heteropogon hirtus*), ornament

පිවිස, *pp.* having entered, having arrived [ing

පිවිසි(or සු)ම(ම), *n.* (*go.* පිවිසෙන) entering, arriv

පිවිසෙන, *vi.* to enter, to arrive (පිවිසුණු)

පියූ, *ppa.* (from පියා) shut, closed

පිශාච-යා, n. gobbling, sprite

පිශුන, a. slanderous, back-biting, malicious

පිෂ්ට, a. powdered, crushed. n. -ය, flour

පිස්ක(or කා)ල්(*b.*), *n.* fiscal (*D.* or *E.*)

පිස්තෝල-ය, *n.* pistol (*Pg.*) [ing

පිස්නා, *prpa.*=පිසින (from පිස) wiping, sweep

පිස්සන්ගේකොටු-ව, *n.* lunatic asylum

පිස්සා(පිස්සු), *n.* mad man, sweeper (*pl.* පිස්සෝ) (*f.* පිස්සි)

පිස්සු, *a.* mad, insane. *n.* -ව, කම, insanity

පිස්සුවැටෙ(or වෙ), *vi.* to become mad, to be seized with fury

පිස, *vt.* to cook (පිසූ); *pp.* having cooked, [having wiped

පිසදමා, *vt.* to sweep, to wipe (පිසදැමූ)

පිසන්නා(පිසන), *n.* cook (*pl.* පිසන්නෝ)

පිසනගෙය-ය, *n.* kitchen

පිසාවා(ව්), *n.*=පිහාවටා

පිසි, *vt.* to sweep, to wipe (පිස්ස); *ppa.* cooked, [wiped

පිකිඹ, *n.* margosa tree (කොහොඹ)

පිසි(or සු)ම(ම්), *n.* (*go.* පිස, පිසි) cooking, wiping

පිසුන(නු), *n.* slander

පිසූ, *ppa.* (from පිස) cooked

පිහ, *vt.*=පිස

පිහදමා, *vt.*=පිසදමා

පිහන්නා(පිහන), *n.*=පිසන්නා

පිහනගෙය-ය, *n.*=පිසනගෙය

පිහකරුලු, *n.* cook

පිහාටුව(පිහාටු), *n.* feather, quill

පිහාඹ, *vi.*=පීනාඹ

පිහාසර්කර, *vi.*=පීනාසර

පිහි, *vt.*=පිසි; *ppa.* wiped, set aside

පිහිතුළු, *a.* covered, closed

පිහිට, *n.* help, favour

පිහිට, *vi.* to situate, to be established
පිහිටව, *vt.*=පිහිටුව (පිහිටෙවු)
පිහිටෙව, *vi.* to help, to assist
පිහිටාධාර-ය, *n.* help, assistance [established
පිහිටි, *ppa.* (from පිහිටා) placed, situated,
පිහිටුව, *vt.* to place, to establish (පිහිටෙවු)
පිහිණ, *vi.*=පීන (පිහිණූ)
පිහිත, *a.* covered, concealed
පිහිය, *n.* knife (*pl.* පිහියා) (*M.*)
පිහිර(ි), *n.*=පිර
පිහිර, *vt.*=පිර (පිහිරූ)
පිහිල්ල(පිහිලු), *n.*=පිල්ල
පිහා, *pp.* having rejected or set aside
පිසකාර-යා, *n.* servant, slave (*pl.* පිසකාරයෝ)
පිළ(ේ), *n.* verandah, raised part in a verandah
පිළ-වා, *n.* young of any animal, grub, maggot (*pl.* පිළවු)
පිළා(ළු), *n.* cripple, young of any animal, grub
පිළි, *up.*=ප්‍රති
පිළි(*b.*), *n.*=පිළ, පිළවා and පිළා
පිළිඇදුර(රු), *n.* rival teacher (පිළිඇදුරු) [seat
පිළිකඩ, *n.* raised part in the verandah, raised
පිළිකන්ද(-කඳු), *n.* back of the house
පිළිකම(ම), *n.*=පිළිකම
පිළිකා-ව, *n.* abscess, cancer

පිළිකුල(ල්), *n.* disgust, loating, filth (*c.* ප්‍රතිකූල)

පිළිකෙව(වි), *n.*=ප්‍රතික්ෂේපය

පිළිකේ(කු-ය), *n.*=පිළිකාව

පිළිගත්, *ppa.* (from පිළිගනී) accepted, received

පිළිගඳ, *n.* smell of fishes

පිළිගනී, *vt.* to accept, to receive

පිළිගැනී(or නු)ම(මි), *n.*(*go.* පිළිගනී), acceptance

පිළිණ, *n*, promise, agreement

පිළිතුර(රු), *n.* rejoinder

පිළිතොරණ, *n.*=පිළිතොරණ

පිළිදනී, *vt.* to protect, to support (පිළිදුනු)

පිළිදුනී(or නු)ම(මි), *n.* (*go.* පිළිදනී) protecting, supporting

පිළිසසේ, *vi.* to become stale

පිළිපත්, *a.*=ප්‍රතිපන්න

පිළිපදී, *vt.* to preserve, to keep, (පිළිපැදූ)

පිළිපත්, *n.*=ප්‍රතිපත්ති

පිළිපැදී(or දු)ම(මි), *n.* (*go.* පිළිපදී) keeping, observing

පිළිපෙරළි-ය, *n.* metathesis of vowels

පිළිපොව, *vt.* to entrust, to deliver (පිළිපෑවු)

පිළිබඳ, *a.* attached, connected with

පිළිබෙත්, *a.*=පිළිවත්

පිළිබසී, *vt.* to subdue, to control (පිළිබෑසු)

පිළිබෑසී(සු)ම(මි), *n.* (පිළිබසී) subduing

පිළිබිඹ(ඹු), } *n.* likeness, image, shadow
පිළිබිම-ය, }

පිළිමල්ලා(ල්), *n.* enemy, opponent
පිළිමිණ(ණි), *n.* crystal
පිළිබුත්(*b.*), *n.* adorning, change
පිළි-ය, *n.* cloth [medicine
පිළියම්කර, *vt.* to mend, to cure, to practise
පිළියම(මි), *n.* counter-action, mending, remedy,
retaliation
පිළියෙල කර, *n.* to prepare, to make ready
පිළිරැව(වි), *n.* echo, resonance
පිළිරූ-ව, *n.* likeness, image [*thus longiflorus*)
පිළිල-ය, *n.* parasite growing on trees (*loran-*
පිළිලොම(මි), *n.* inverse order (*v.* ප්‍රතිලෝම)
පිළිවක්(*b.*), *n.* enemy, resemblance
පිළිවත්(*b.*), *n.* wisdom, resemblance
පිළිවදන(න්), *n.* answer, reply. *vt.* -දෙ, to reply
පිළිවන්, *a.* = පුළුවන්, able, possible [විසි)
පිළිවිත්(or ත), *vt.* (he or she) inquired (*v.* පිළි
පිළිවිසි, *vt.* to inquire, to ask (පුළුවිසි, පිළිවිස්ස)
(*v.* පිළිවිත්) [asking
පිළිවිසි(or සු)ම(මි), *n.* (*go.* පිළිවිසීම) inquiring,
පිළිවිදු, *ppa.* known, perceived
පිළිවෙත්කර, *vt.* to treat medically, to perform
propitiatory rites [remedy
පිළිවෙත(ත්), *n.* conduct, religious practice,
පිළිවෙළ, *n.* order, method, degree

පිළිසතු, *a.* belonging to others

පිළිසඳ, *n.* embrella

පිළිසඳ, *n.*=ප්‍රතිසන්ධිය

පිළිසඳර, *n.* friendly greeting, friendly conversation

පිළිසත්, *a.* covered, hidden

පිළිසමුපා(*b.*), *n.*=පටිච්චසමුප්පාදය

පිළිසරණ, *n.* help, patronage

පිළිසිඳගනී, *vi.* to conceive (in the womb)

පිළිසිඳීම(ම්), *n.* (*go.* පිළිසිඳේ) conception

පිළිසිඳේ, *vi.* to conceive, to be generated (පිළිසිඳුණු)

පිළිසිඹියා-ව, *n.*=ප්‍රතිසම්භිදාව

පිළිසුන්, *a.* covered, conceived

පිළිවදන(න්), *n.* reply, answer

පිළිහුඩුපලා, *n.* braken (*pteris thalictroides*)

පිළිහුඩු-වා, *n.* kingfisher (*ceryle rudis, halcyon smyrnensis*)

පිළිසෝතගාමි-යා, *n.* one going against the stream, one engaged in uphill work

පිළි, *n.* cloth, fish smell, filth, arrangement

පිළිකඩ, *n.* piece of cloth, handkerchief

පිළිතොරණ, *n.* triumphal arch ornamented with cloth, fruit, etc.

පිළු(*b.*), *n.* lame man, cripple, young of an animal, raised part of a verandah, cloth

පිළුණ(or ණු), *a.* stale. *vi.* පිළුණ(or ණු)වෙ, to become stale

පිංච, n. (from පුංචි), little thing

පී, *ppa.* drunk, rejected, covered

පීගාදු(*b.*), *n.* liver of animals (*Pg.*)

පීඨ-ය, *n.* chair, seat, stool

පීඩන-ය, *n.* oppression, affliction

පීඩාකර, *vt.* to oppress, to afflict

පීඩා-ව, *n.* affliction, pain, suffering

පීඩිත, *a.* oppressed, tormented

පීත්ත, *n.* ribbon (*Pg.*)

පීත, a. drunk, soaked in, yellow

පීතන, n. hog-plum tree (*spondias mangifera*: ඇඹරැල්ල)

පීතමණි-ය, *n.* topaz

පීතාම්බර(*b.*), n. epithet of Vishnu, a religious mendicant wearing yellow garments

පීතාශ්මන්(*b.*), n. yellow gem, topaz

පීදෙ, *vi.* to form ears or bear fruit (for the first time) (පීදුණු)

පීන, a. fat, large, full, big

පීන, *vi.* to swim (පීනූ)

පීනස(*b.*), *n.* catarrh, cold affecting the nose

පීනි(or නු)ම(මී), *n.* (*go.* පීනන) swimming

පීප්ප-ය, *n.* cask (*Pg.*)

පීම(මී), *n.* (*go.* පා) drinking, drink

පීර, *n.* file, rasp (*Pg.*)

පීර, *vt.* to comb (පීරූ)

පීරිගා, *vt.* to file (පීරිගෑ)

පීරිසි-ය, *n.* saucer (*Pg.*)

පීල්ල(පීලි), *n.* spout, conduit, gutter

පීහ(or පූ), *vt.* (they) drank, rejected, covered

පිහි-ය, *n.* knife (*M.*)

පුක්කස, n. } (*b.*) name of a degraded
පුක්කුස, *n.*(*P.*) } mixed caste

පුක්පැනි, *vi.* to start from the socket

පුක(ක්), *n.* posteriors, anus, ball of the eye

පුකිරි-ය, *n.*=[illegible]

පුඟුල(or ඟු)ලා(ල), *n.*=පුද්ගලයා:

පුංජ-ය, n. heap, collection, multitude

පුච්ඡ-ය, n. tail, peacock's tail

පුච්ඡා-ව, *n.* questioning, question (*P.*)

පුඤ්චා(පුඤ්චි) *n.* little one

පුඤ්චි, *a.* small, little. *n.* -කම(ම), disparagement, disgrace

පුඤ්චිකර, *vt.* to reduce in size, to disparage

පුඤ්ජ-ය, n.=පුංජය

පුටක-ය, n. cup, cavity, vessel made of leaves

පුටදෙ, *vt.* to calcine metals, to prepare medicines by the operation of fire

පුටපාක-ය, n. a perticular method of preparing drugs in which the various ingredients are wrapped up in leaves and being covered with clay, are roasted in the fire), digesting

පුටභේද-ය, n. town, city, ako. of musical instrument, opening [cover, eyelid

පුට-ය, n. fold, cavity, vessel of leaves, sheath,

පුටු, *ppa.* nourished, protected

පුටු-ව, *n.* chair

පුඩුකර, *vt.* to collect, to add

පුඩු-ව, *n.* loop of a snare, aperture of the nose, tip or point of anything, multitude

පුණ්ඩරීක-ය, n. white lotus flower, white colour

පුණ්‍ය, a. holy, sacred, pure, good, meritorious, lucky. n. -ය, virtue, religious or moral merit, meritorious act.

පුණ්‍යවන්ත, a. blessed, fortunate, virtuous

පුණ්ණක්කු, *n.* oil cake (left after the oil has been expressed), poonac (*T.*)

පුන්, *a.* full, complete. *n.* -පොහොය-ය, -දිය (සි), day of fullmoon

පුඬුරු-ව, *n.* casket, present

පුත්, *n.* (*bo.* පුතා) son

පුත්‍රදාර-වෝ, n. children and wife

පුත්‍රපෞත්‍ර-යෝ, n. sons and grandsons

පුත්‍ර-යා, n. son, dear child (*pl.* පුත්‍රයෝ)

පුත්‍රී, n. daughter (*pl.* පුත්‍රීයෝ)

පුත(ත්), *n.* son (*voc.*)

පුතණුව, *n.* dear son (*voc.*)

පුතනු-වෝ, *n.* dear son

පුතා(ත්), *n.* son (*pl.* පුත්තු) [පුද්ගලයෝ)

පුද්ගල-යා, n. individual, person, man (*pl.*

පුද්ගලික, a. individual, personal

පුද, *n.* offering, worship. *n.* -ඔලොක්කම්, offerings and presents

පුද, *vt.* to offer, to make offering (පිදු)

පුදකර, *vt.* to offer, to consecrate

පුදුම-ය, *n.* surprise, wonder (*T.*)

පුදුමවෙ, *vi.* to be surprised, to wonder

පුන්, *a.* full, complete, masculine

පුන්කලස(ස), } *n.* full jar, jar or vessel filled
පුන්කුඹ(ඹු), } with water and flowers

පුන්නාග, n. white lotus, a tree (*calophyllum inophyllum*: දොඹ), nutmeg (සාදික්කා)

පුන්පැලා, *n.* = පුන්කලස

පුන්සඳ, } *n.* full moon
පුන්සිසි, }

[පුනපුනා, again and again

පුන, *n.* = දොඹ. *part.* again, back, afterwards;

පුනර්(or ඃ), part. again, anew

පුනර්භව-ය, n. re-birth, transmigration

පුනම්පු-ව, n. = පුනාවස

පුනරුක්ත, a. said again, repeated, superfluous

පුනරුක්ති-ය, n. repetition, superfluity, tautology

පුනරුත්, *a.* = පුනරුක්ත

පුනා, *n.* jar, pitcher, pot

පුනාවස, *n.* 7th lunar mansion (consisting of two or four stars), Pollux

පුනිලෙ-ය, *n.* funnel (*Pg.*)

පුප්, a. expanded, blown, risen (*v.* පුපා)

පුප්ප, *vt.* to bloat, to leaven (පිප්පු)

පුප්පාකා, *vi.* to eat at another's expense

පුප්නා, *prpa.* (from පුප=පිපෙ) blowing, expanding, rising

පුප්මි, *n.* nectar of flowers

පුප(ප්), *n.* flower, a kind of boil

පුපුර(රු), *n.* spark, particle of anything

පුපුරු, *vi.* to burst (පිපිරු)

පුපුරුනා, *vi.* to smart, to give pain

පුපුල, *n.* a creeping plant (*vernonia zeylanica*)

පුබ්බරු(ර), *n.* unfledged bird, grub

පුබුදු, *vi.* to be awakened (පිබිදුනු)

පුබුදු, *a.* expanded, blown (of flowers)

පුබුදුව, *vt.* to awake, to rouse (පිබිදෙව්)

පුම්බ, *vt.* to puff (පිම්බු)

පුං, *a.* masculine. *n.* -ලිංග-ය, masculine gender

පුම,
පුමස, } (*b.*) *n.* man

පුම්ස්ධ(or ධ්‍ව)ජග(ය), *n.* male organ

පූඩ්(or ර), *n.* hair-powder (*Pg.*)

පූලුයිස්, *n.*=පුති ගල්ල (*Pg.*)

පුංශි-යා, n. (*ifo.* පුරුෂයා)

පුර, *n.* city, town, inner apartment of a palace for queens and ladies, front, bright half of the lunar month, house (*v.* පුරය)

පුර, *vt.* to begin, to swell, to fit (පිරු)

පුරඟන, *n.* female citizen, women occupying the female apartments in a palace

පුරජේරු-ව, *n.* vain show, big talk

පුරංගෙ(ගේ), *n.* fallow or waste land

පුරද්වාර, *n.* city gate, front door of a house

පුරඳු(or රු), *n.* } (*b.*)epithet of *Sakra*
පුරඳර, n. }

පුරථපටිබු-ය, *n.* sound of signal drum

පුරප්පාඩු-ව, *n.* vacancy

පුරපසළොස්වක(ක්), *n.* 15th (full moon) day of the 1st half af a lunar month

පුරඹින, } (*b.*) *n.*=පුරඟන
පුරඹ, }

පුර-ය, n. city, town, castle, house, body, female apartment, upper story, store-house

පුරව, *vt.* to fill (පිරෙවූ)

පුරව, *n.* former time

පුරවඩ, *vt.* to commence the work of a field by clearing jungle, etc.

පුරවලිසම(ම), *n.* medicinal application to eyes

පුරවාදේ, *vt.* to fill up

පුංස්කෝකිල(or ‑කොවුලු)ලේ-ලා, *n.* Indian cuckoo

පුරස්ත්‍රී, n.=පුරඟනා

පුරස්සර, *a.* preceded by, attended with

පුරහ(or හා)ඳ, *n.* moon in the 1st half of the lunar month, full moon

පුරං(*b.*), *n.*=පුරණ

පුරංමැඩවුම(ම්), *n.* first turning up of mud [in a field

පුරංහී-ය, *n.* first ploughing

පුරා, *pp.* (from පුර) having filled, full; fully

පුරාකෘත, a. done formerly

පුරාජේරු-ව, *n.*=පුරජ්ජේරුව

පුරාණ, a. old, ancient. n. -**ය**, past event or occurrence,| tale of the past, ancient or legendary history, name of certain well-known sacred books of the Hindus, excrement

පුරාතන, a. old, ancient. n. -ය, olden times. n, -යා, man of old

පුරාම, *ad.* (*efo.* පුරා) fully, completely, every-[where

පුරාරම්භ-ය, *n.*=ප්‍රාරම්භය

පුරි (or රී)(*b.*), n. city, town

පුරිපු(*b.*), *n.* vain talk, prating

පුරිසා(ස්), *n.* man, person

පුරීෂ-ය, n. fæces, excrement, dirt

පුරු(*b.*), n. name of a prince (6th monarch of the lunar race)

පුරුක්, *n.* a p'ant (*asystasia coromandeliana*)

පුරුක්ගැලෙ, *vi.* to drop off at the joints, to cry violently

පුරුක්තණ, *n.* hard grass (*rottboellia tinctoria*)

පුරුක(ක්, කු), *n.* joint, knot (in a bamboo, etc.), knob, link

පුරුත, *n.* method, order, arrangement

පුරුද්ද(පුරුදු), *n.* custom, usage, habit

පුරුද්ද, *vt.* to fit one thing into another (පිරිද්දු)

පුරුදු-ව, *n.*=පුරුද්ද. *vi.* -වෙ, to be accustomed to

පුරුෂත්ව-ය, n. manhood, manly nature

පුරුෂනිමිත්ත(-මිති), n. male organ of generation

පුරුෂ-ය, n. person (in grammar)

පුරුෂ-යා, n. man, husband, servant, officer

පුරුෂලිඞ්ග-ය, n.=පුල්ලිඞ්ගය [brave man

පුරුෂසිංහ-යා, n. distinguished or eminent man,

පුරුෂෝත්තම-යා, n. excellent man, highest being

පුරුසා(ස්), *n.* man, person

පුරෝහිත-යා, n. family-priest, one who conducts all the ceremonial rites of the family

පුල්(*b.*), *n.* flower, stone (*v.* පුම). *a.* blown (of a flower)

පුෂ්කරාල, *n.* ako. drug (සතාවරිං, පොඩි)

පුල්ලිඞ්ග-ය, n. masculine gender

පුල්ලි-ය, *n.*=පුල්ලිය. dot, spot, freckle

පුල්ලෝරම(ම්), *n.* rasp [(පිලු)

පුල, *vi.* to spring forward, to desire eagerly

පුලස්සා(-ලස්සු), *n.* poor man of a respectable family (*pl.* පුලස්සෝ)

පුලමුල්, *n.* lotus (පියුම්) [lonnaruva

